# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2286/19 - 2022 ජූනි මස 27 වැනි සඳුදා - 2022.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : Bu/Ln/1/1/35-ii.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2017/VE/353.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක මූලික පිඹුරු 4790 ඉඩම් කැබලි අංක 1, 2, 3, 4හි සඳහන් ඔෂින්ටන්වත්ත ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6.0702හි මායිම් පහත දැක්වේ:

01. **කැබලි අංක 01 - ඔෂින්ටන්වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 5.5841**

උතුරට: මාර්ගය සහ මූ.පි.ක. 1563හි කැබලි අංක 01; නැගෙනහිරට: මූ.පි.ක. 1563හි කැබලි අංක 01, මෙම පිඹුරේ කැබලි අංක 02 හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් දඹල ඇල වත්ත (හිපි 86536); දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 02, මූ.පි.ක. 1563හි කැබලි අංක 01, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් දඹල ඇලවත්ත (හිපි 86536) සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

02. **කැබලි අංක 02 - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0418**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 01 සහ මූ.පි.ක. 1563හි කැබලි අංක 01; නැගෙනහිරට: මූ.පි.ක. 1563හි කැබලි අංක 01 සහ මෙම පිඹුරේ කැබලි අංක 03; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 03, මූ.පි.ක. 1563හි කැබලි අංක 01, සහ මෙම පිඹුරේ කැබලි අංක 01; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 01

03. **කැබලි අංක 03 - ඔෂින්ටන්වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.4012**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 02 සහ මූ.පි.ක. 1563හි කැබලි අංක 01; නැගෙනහිරට: මූ.පි.ක. 1563හි කැබලි අංක 01; දකුණට: මූ.පි.ක. 1563හි කැබලි අංක 01 සහ මෙම පිඹුරේ කැබලි අංක 02; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 02.

04. **කැබලි අංක 04 - ඔෂින්ටන්වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0431**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 01; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 01 සහ මූ.පි.ක. 1563හි කැබලි අංක 01; දකුණට: මූ.පි.ක. 1563හි කැබලි අංක 01 සහ මෙම පිඹුරේ කැබලි අංක 01; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 01.


1A - G 37013 – 21 (2022/06)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අගෝස්තු මස 29 වැනි දින පෙ.ව. 10.30ට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 අගෝස්තු මස 29 වැනි වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩමට / පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකකින් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. ආර්. ප්‍රසාද් පෙරේරා,
ප්‍රාදේශීය ලේකම් ,
බුලත්සිංහල.

2022 ජුනි මස 21 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06-0206